Remove Watermark Now


**11 ශ්‍රේණිය** | **පිළිතුරු පත්‍රය - I පත්‍රය** | **ඉතිහාසය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(4) | 3 -(3) | 4 -(4) | 5 -(2) | 6 -(1) | 7 -(4) | 8 -(1) | 9 -(2) | 10 -(4) |
| 11 -(1) | 12 -(2) | 13 -(3) | 14 -(2) | 15 -(4) | 16 -(1) | 17 -(3) | 18 -(4) | 19 -(1) | 20 -(2) |
| 21 -(4) | 22 -(3) | 23 -(1) | 24 -(4) | 25 -(2) | 26 -(2) | 27 -(1) | 28 -(3) | 29 -(3) | 30 -(1) |
| 31 -(2) | 32 -(3) | 33 -(1) | 34 -(2) | 35 -(3) | 36 -(4) | 37 -(1) | 38 -(4) | 39 -(3) | 40 -(3) |


(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II පත්‍රය - I කොටස

(01) (අ) (i)



(ii)



(ආ) (i) A - වසභ රජු B - සිත්නාරුබිම බුදල්නා / බුද්ධරාජ C - ෆන් එංගල් බෙක් D - වෙන්හෝ

(ii) 1. පබළු මාලය 2. ඉබ්බන්කටුව සුසාන භූමියෙන් 3. ක්‍රි.පූ. 700 - 450

4. ප්‍රභූවරුන්ගේ ජීවිතයේ සුඛිත මුදිත බව / පබළු වැනි දේ ආනයනය කර තිබීම

(iii) 1. V විලියම් රජු 2. බ්‍රිතාන්‍යයට / එංගලන්තයට 3. කිව් ලිපිය

4. ඉංග්‍රීසින් විසින් ලන්දේසීන් සතුවූ ත්‍රිකුණාමලය වරායට පහර දීම / ලන්දේසීන් සතු ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ ඉංග්‍රීසින්ට අයිති වීම



Papers.lk pdfelement

## II - කොටස

(02) (i) කුරුවිට බටදොඹ ලෙන, පාහියන්ගල ලෙන, කිතුල්ගල බෙලිලෙන, අත්තනගොඩ අළුලෙන (ලකුණු 1 x 3 = 03)

(ii) පිළිස්සූ මැටි වළං භාවිතය / යකඩ ලෝහ භාවිතය / ක්‍රමවත් සුසාන චාරිත්‍ර විධි අනුගමනය කිරීම / ස්ථිරවාසි නිවාස ඉදිකිරීම / කෘෂිකාර්මික කටයුතු ආරම්භ කිරීම (ලකුණු 2 x 2 = 04)

(iii) භූ භෞතික පිහිටීම ප්‍රධාන කරුණයි / වාර්ෂික වර්ෂාපතන අගය. / පසේ ස්වභාවය / භූ විෂමතාවය / ස්වාභාවික සම්පත්වල ව්‍යාප්තිය / ජලවහනය

(කරුණු 2 ට ලකුණු 2 යි. විස්තරයට ලකුණු 3 යි. මුළු ලකුණු 05)

(iv) A ගමික (ලකුණු 01)

B පරුමක (ලකුණු 01)

C ගම්වල පොදු කටයුතුවලට නායකත්වය දීම / ගමට අයිති වැව නඩත්තු කිරීම / ගම්වල ඇතිවන සුළු ආරවුල් විසඳීම / ගම තුළ හා ගම් අතර සාමය පවත්වාගෙන යාම / ගම් නායකයන් සමග සුහදව කටයුතු කිරීම / ගමේ ජනතාවගේ අපහසුතා අවස්ථාවල සහය / උදව් දීම (කරුණු 4 ට ලකුණු 04)

03 (i) A පණ්ඩුකාභය රජතුමා

B ධාතුසේන රජතුමා

C මහසෙන් රජතුමා (ලකුණු 1 x 3 = 03)

(ii) කෙටුකහබ, කැති අඩ (ලකුණු 04)

(iii) දේශීය වෙළඳාම

* වෙළඳාම පැවැති නගර හැඳින්වීමට පුර යන පදය යොදාගෙන ඇත. අනුරාධපුර, මාගම්පුර
* 'අබලවපර' නම් සියඹලා වෙළෙන්දකු පිළිබඳව සීගිරියේ සෙල්ලිපියක තොරතුරු වාර්තා වේ.
* වෙළෙන්දෝ සමූහ ලෙස එක්ව ක්‍රියාකර ඇත. පූගය, නියමස්ථාන ලෙස ඒවා හඳුන්වා ඇත. නානාදේසි, වලඤ්ඤයාර්, අයින්නුරුවර් නිදසුන් වේ.

(මෙවැනි කරුණු 2 ට ලකුණු 02 යි. විස්තරයට ලකුණු 03 යි. මුළු ලකුණු 05 යි.)

(iv)
* මෙරට ඉතිහාසයේ සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට මුලිකත්වය ලබාදීම.
* සියවස් හතරකට අධික කාලයක් රට පාලනය කළ එළාරගෙන් රට නිදහස් කර ගැනීම.
* මාතොට වැනි සරු වෙළඳාමක් කළ අන්තර්ජාතික වරාය නිදහස් කර ගැනීම.
* බුද්ධ ශාසනයේ දියුණුවට විශාල සේවාවක් සිදුකිරීම.

(මෙවැනි කරුණු 3 ට ලකුණු 03 යි. විස්තරයට ලකුණු 03 යි. මුළු ලකුණු 06 යි.)

04 (i) A දිග B බර C අවකාශය (ලකුණු 1 x 3 = 03)

(ii) A කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය

B හෝපිටිගමුව සෙල්ලිපිය

C මිහින්තලා පුවරු ලිපිය

D වේවැල්කැටිය සෙල්ලිපිය (ලකුණු 1 x 4 = 04)

(iii) (a) නගර නිර්මාණය, ගෘහ නිර්මාණය, චෛත්‍යය නිර්මාණය, උද්‍යාන නිර්මාණය (මින් කරුණු 2 කට ලකුණු 02 යි.)

(b)
* පණ්ඩුකාභය රාජ්‍ය සමයේ පවා මාතෘ නිවාස ඉදිකර තිබීම.
* දුටුගැමුණු රජතුමා රෝහල් 10 ක් ඉදිකළ බවට තොරතුරු ලැබී ඇත.
* සෙල්ලිපිවල වෙජ, මහවෙදනා, විවිධ අංශ සඳහා විශේෂ වෛද්‍යවරුන් ගැන සඳහන් වේ.
* කැණීම්වලදී පැරණි රෝහල්වල නටබුන් ලැබී ඇත. පොළොන්නරුව ආලාහන පිරිවෙන් ඇස් රෝහල
* ඔසු උයන්, වෙදදුරන්ට ගම්බිම් පිදීම ගැන සඳහන් වේ.
* රජවරුද වෛද්‍යවරු වී ඇත. බුද්ධදාස රජතුමා සතුන්ට පවා වෙදකම් කර ඇත.
* ගොඩනැගිලිවල නිසි පරිදි අපද්‍රව්‍ය බැහැර කිරීමට කාණු, නල පද්ධති සවිකර තබී ඇත.
* සූපවේදය සඳහා දක්ෂ කාන්තාවන් මධුපාචිකා යන ගෞරව නාමයෙන් ඇමතීම
* පරිසර හිතකාමී කැසිකිළි ක්‍රම (ජේතවනය කැසිකිළි සඳහා අඟුරු, මැටි භාජන භාවිතය)
* පෝෂ්‍යදායක ආහාර රටාව, ආහාර වර්ග භාවිතය

(මෙවැනි කරුණු 3 ක් සඳහා ලකුණු 03 යි.)

(iv)
* කාන්තාවන් රාජ්‍යත්වයට පත්වීම.
* ප්‍රාදේශීය පාලකයන් වීම.
* රූපලාවණ්‍ය කටයුතු කිරීම - ඉබ්බන්කටුව පබළු මාලය / රංචාමඩම ඇසු අඳුන් ගැල්වූ උපකරණ
* දක්ෂ සූපවේදිනියන් සිටීම - මධුපාචිකා නාමය / අශෝකමාලා දුටුගැමුණු රජුගේ සිත් දිනා ගැනීම
* ශාසනික සේවාවන් සඳහා දායකත්වය දැක්වීම - දේවානම් පියතිස්ස රජුගේ බිසව පැවිදිවීම

(ලකුණු 3 + 3 = 06)

05 (i) A අනුරාධපුරය - (ලකුණු 01)

B දඹදෙණිය, යාපහුව, කුරුණෑගල, ගම්පොළ, කෝට්ටේ

(මින් දෙකක් නම් කිරීමට ලකුණු 02) (1 + 2 = ල. 03)



Remove Watermark Now
Pastpapers.lk
pdf element

Remove Watermark Now

(ii) * දුර්වල පාලකයන් බලයට පත්වීම.
* කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයින් අතර ඇති වූ බල අරගලය
* ආර්ථිකය පරිහානියට පත්වීම (කෘෂිකාර්මික හා වෙළඳ කටයුතු අඩපණ වීම)
* මධ්‍යගත පාලනය බිඳවැටීම.
* කාලිංග මාඝ ආක්‍රමණය
* වෙළඳාම හා ගමනාගමන කටයුතු අඩපණ වීම.
* වසංගත රෝග ව්‍යාප්ත වීම.
* ජනතාව නිරිත ඇතුළු වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම (කරුණු 2 ට ලකුණු 04 කි.)

(iii) * II පරාක්‍රමබාහු රජතුමා උගතකු හා බුද්ධිමතකු වූ බැවින් එතුමාට පැමිණෙන අභියෝග හමුවේ නොසැලී පෙරට ගමන් කළ අයෙකි.
* 1255 දී පමණ කාලිංග මාඝ මෙරටින් පලවා හැර ආක්‍රමණිකයන්ගෙන් රට නිදහස් කර ගැනීම.
* චන්ද්‍රභානු නම් ජාවක රජ දෙවරක් පලවා හැර විදේශ බලවේගවලට මුහුණ දීම.
* දේව පතිරාජ ඇමති යොදවා ආර්ථික, ආගමික, අධ්‍යාපනික අංශ දියුණු කිරීම.
* "කව්සිළුමිණ" වැනි විශිෂ්ඨ සාහිත්‍ය ග්‍රන්ථ රචනා කරමින් සාහිත්‍යයට විශාල සේවාවක් සිදුකිරීම.
* කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත උපාධි නාමයෙන් පිදුම් ලැබීම. (කරුණු 2 ට ල. 2 යි. විස්තරයට ල. 3 යි. මුළු ලකුණු 05 යි.)

(iv) * ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථාන පවත්වාගෙන ගිය වන්නි ප්‍රදේශ යටත් කර ගැනීම.
* කෝට්ටේ රාජ්‍යයට එරෙහිව උඩරට ජෝතිය සිටානන් ඇතිකළ කැරැල්ල මැඩපවත්වා මධ්‍ය පාලනයට අවනත කර ගැනීම.
* සපුමල් කුමරු යාපනයට යවා ද්‍රවිඩ පාලකයන්ගෙන් එම ප්‍රදේශ මුදාගැනීම.

මේ කරුණු අනුව අවසානවරට මෙරට එක්සත් කළ පාලකයා ලෙස මෙතුමා ඉතිහාසගත වී ඇත.
(කරුණු 2 ට ල. 3 යි. විස්තරයට ල. 3 යි. මුළු ලකුණු 06 යි.)

06 (i) 1. පෘතුගීසි 2. ලන්දේසි 3. ඉංග්‍රීසි (ලකුණු 1 x 3 = 03)

(ii) A පේරෝ ලෝප්පැස් ද සූසා B දොන් ජෙරනිමෝද අසවේදු
C කොන්ස්තන්තීනු ද සා D දියෝගෝ ද මේලෝ (ලකුණු 1 x 4 = 04)

(iii) (a) අභියෝග
* රාජ්‍යත්වය සඳහා උරුමයක් නැතිවීම.
* පෘතුගීසීන්ගේ බලපෑම්වලට නිරතුරුව මුහුණදීමට සිදුවීම.
* සීතාවක රාජ්‍යයෙන් එල්ලවන බලපෑම්වලට ලක්වීම නිසා ඒවායින් උඩරට මුදාගැනීම.
* පරිහානියට පත් බුදු සසුන යළි ගොඩනැගීම
* ආර්ථික කටයුතු සංවර්ධනය කිරීම.

(b) අභියෝග ජය ගැනීම
* කුසුමාසන දේවි කුමරිය විවාහ කර ගැනීම තුළින් රාජ්‍ය උරුමය තහවුරු කර ගැනීම.
* රෝමානු කතෝලික ආගම අතහැර බෞද්ධයකු වීම.
* දෙල්ගමුව විහාරයේ සඟවා තිබූ දන්ත ධාතූන් වහන්සේ මහනුවරට වැඩම කරවීම.
* දළදා මාලිගාවක් තනවා දන්ත ධාතූන් වහන්සේ එහි තැන්පත් කිරීම. (ලකුණු 2 + 3 = 05)

(iv) (a) සමාජ සංවිධානය
* රටේ සියලු ඉඩම්වල හිමිකරුවා රජු බවට පිළිගැනීම.
* ඉඩම් අයිතිය භුක්තිය පදනම් කරගෙන බෙදී තිබීම, ගබඩාගම්, නින්දගම්, විහාර දේවාලගම්, පරවේණිගම්)
* රටවැසියන් රජුවෙනුවෙන් සේවය සඳහා බැඳී සිටීම රාජකාරිය ලෙස හැඳින්වීම.
* ග්‍රාමීය ජන සමාජයක් පැවතීම.
* සමකුල විවාහ
* විවාහ ක්‍රම කිහිපයක් තිබීම.
* ප්‍රධාන සමාජ ඒකකය පවුල (මෙවැනි කරුණු තුනකට ලකුණු 03 යි.)

(b) රාජද්‍රෝහිත්වය සම්බන්ධ නඩු / කුමන්ත්‍රණ නඩු / කැරලි කෝලාහල සම්බන්ධ නඩු / වැදගත් නායකයන් සම්බන්ධ නඩු / විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු (කරුණු 3 ට ලකුණ 3 යි. 3 + 3 = 06)

07 (i) ජෝන් පයිබස්, හියුබොයිඩ්, රොබට් ඇන්ඩෲස් (ලකුණු 03)

(ii) A පෙඩ්රික් නෝර්ත් B ජෝන් ඩොයිලි C පිළිමතලව්වේ
D පූජ්‍ය වාරියපොළ ශ්‍රී සුමංගල හිමි (ලකුණු 04)

(iii) (a) * බදු එකතු කිරීමට දේශීය නිලධාරීන් වෙනුවට මුදුරාසි නිලධාරීන් පත්කිරීම.
* තාඩන පීඩන සිදුකර බදු එකතු කිරීම.
* ස්වදේශීය නිලධාරීන් නොසලකා හැරීම.
* මුදලින් බදු එකතු කිරීම.
* පොල්ගස් බද්ද වැනි නව බදු පැනවීම.
* රටවැසියාට සිදුවන හිරිහැර පිළිබඳ නිලධාරීන්ට පැමිණිලි කළද සාධාරණයක් ඉටු නොවීම. (මෙවැනි කරුණු 3 කට ලකුණු 03 යි.)



papers.lk
pdfelement

Remove Watermark Now



(b) * බදු එකතු කිරීමට දේශීය නිලධාරීන් යළි යෙදවීම.
* නව බදු වර්ග අහෝසි කිරීම.
* බදු එකතුකිරීමට හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිළධාරීන් පත්කිරීම.
* ලන්දේසි උසාවි ක්‍රමය යළි ස්ථාපිත කිරීම. (කරුණු 2 ට ලකුණු 02 යි. 3 + 2 = 05)

(iv) (a) වීරපුරන් අප්පු, ගොංගාලේගොඩ බණ්ඩා, හඟුරන්කෙත ඩිංගිරාළ, දිනෙස්, කුඩාපොළ හාමුදුරුවෝ (ලකුණු 02)

(b) * 1848 කොල්බෲක් යෝජනා අනුව ගෙන ආ ඉඩම් ප්‍රතිපත්තිය මගින් මුඩුබිම් පනත් හරහා ඉඩම් අත්පත් කර ගැනීම.
* ඒ අනුව ඉඩම් අහිමිවීම, කෘෂිකාර්මික කටයුතු අඩපණ වීම.
* ගම්සභාව අඩපණ වීම හා දිස්ත්‍රික් උසාවි ක්‍රමය ගැමියාට පීඩාවක් වීම, (නව අධිකරණ ක්‍රමය)
* රජය හා මහජනතාව අතර සබඳතාවය දුරස්වීම.
* ඉංග්‍රීසි ආණ්ඩුව නව බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
(මුද්දර බද්ද, ඔරු, පාරු බද්ද, තුවක්කු බද්ද, බලු බද්ද, ඇඟ බද්ද)
(මෙවැනි කරුණු 2 කට ලකුණු 02)

(c) * මනාව සංවිධානය නොවීම.
* උඩරට පිළිබඳ මනා අවබෝධයක් තිබීම.
* ඉංග්‍රීසි හමුදා ශක්තිය, ආයුධ බලය ශක්තිමත් වීම.
* සටන උඩරට ප්‍රදේශ කිහිපයකට සීමාවීම නිසා මර්ධනය පහසු වීම.
* ඉංග්‍රීසීන්ට අතිරේක බලඇණි ලැබීම / යුධ නීතිය පැනවීම. (ලකුණු 02)

## III - කොටස

08 (i) A ගැලීලියෝ ගැලිලි  B ජොහැන්නස් ගුටෙන්බර්ග්  C අයිසෙක් නිව්ටන් (ලකුණු 1 x 3 = 03)

(ii) A මාටින් ලූතර්  B ලියනාඩෝ ඩාවින්චි
C මයිකල් ඇන්ජිලෝ  D ජොහැන්නස් කෙප්ලර් (ලකුණු 1 x 4 = 04)

(iii) (a) පෘතුගාලය හා ස්පාඤ්ඤය (ලකුණු 02)

(b) * යුරෝපා ජාතීන් මෙරටට පැමිණීම නිසා යුරෝපය සමග සෘජු වෙළඳ ගනුදෙනු ආරම්භ වීම.
* ඉංග්‍රීසි ජාතිකයෝ මෙරට කෝපි, කොකෝවා, තේ, රබර් වැනි වෙළඳ බෝග වගාව ආරම්භ කිරීම.
* වාණිජ ආර්ථික රටාවකට හුරුවීම නිසා පැවැති ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම.
* ආනයන අපනයන ආර්ථිකයක් බිහිවීම.
* මුදල් භාවිතය ප්‍රචලිත වීම.
* මහා මාර්ග, දුම්රිය මාර්ග, බැංකු, යටිතල පහසුකම් සංවර්ධනය වීම.
* වෙළඳ නගර බිහිවීම.
* වැටුපට වැඩකරන කම්කරු පන්තියක් හා ධනපති පංතියක් බිහිවීම.
(කරුණු 3 කට ලකුණු 03 යි.) (2 + 3 = 05)

(iv) * ආරක්ෂිතව නාවික ගමන්වල යෙදීමට හැකි මාලිමාව, උතුරු තරු මාපකය නිපදවීම.
* ලෝකය ගෝලාකාර බව දැනගැනීම.
* ටොලමි විසින් අඳින ලද ලෝක සිතියම නිසා ලෝකය පිළිබඳ නිවැරදි අවබෝධයක් ලැබීම.
* ජාතික රාජ්‍ය බිහිවීම නිසා මුහුදු ගමන්වලට අනුග්‍රහය දක්වීම.
(කරුණු 3 ක් ඇසුරින් විස්තරයට ලකුණු 3 + 3 = 06)

09 (i) ප්‍රංශය, ස්පාඤ්ඤය, පෘතුගාලය, ඕලන්දය (ලකුණු 1 x 3 = 03)

(ii) A මියුල් යන්ත්‍රය  B වානේ නිපදවීම
C ආරක්ෂක ලාම්පුව  D ගුවන් විදුලි යන්ත්‍රය (ලකුණු 1 x 4 = 04)

(iii) * 16 වන සියවසේ සිට යුරෝපයේ වෙළඳ කටයුතු දියුණු වීම නිසා කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් සිටීම.
* විද්‍යාත්මක පුනරුදය නිසා යන්ත්‍ර සූත්‍ර නිපදවීමේ දැනුම පුළුල් වී තිබීම.
* යන්ත්‍ර තැනීමට හා කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය යකඩ හා වානේ, ඛනිජ සම්පත් බ්‍රිතාන්‍ය සතුවීම.
* නිෂ්පාදිත භාණ්ඩ සඳහා යටත්විජිත වලින් ඉහළ ඉල්ලුමක් තිබීම.
* ඉඩම් කොටුකිරීමේ ව්‍යාපාරය නිසා රැකියා සොයා විශාල පිරිස් නගරවලට සේන්දු වීම හා අතිරික්ත ශ්‍රමය කර්මාන්තවලට යොදාගැනීම.
* දේශපාලන ස්ථාවරත්වය (මෙවැනි කරුණු දෙකක් දක්වා පැහැදිලි කිරීමට ලකුණු 2 + 3 = 05)

(iv) * මහා පරිමාණ ගොවිබිම් ආරම්භ කිරීම.
* ශස්‍ය මාරු ක්‍රමය යොදාගැනීම.
* සත්ත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණය යොදාගැනීම.
* කෘෂිකාර්මික කටයුතු සඳහා නව ක්‍රම හා උපකරණ භාවිතය.
* පොහොර, කෘෂි රසායනික නිෂ්පාදනය වැඩිදියුණු කිරීම.
(මෙවැනි කරුණු තුනක් ඇසුරින් විස්තරයට ලකුණු 3 + 3 = 06)

papers.lk pdfelement